
# රජතුමාගේ උපාය



නදෙව්නි ටමාෂා විජේසුන්දර

# රජතුමාගේ උපාය



නදෙව්නි ටමාෂා විජේසුන්දර

**ISBN - 978-624-206-768-1**

කෘතිය පළ කරන දිනය - **15.11.2023**

කතෘගේ වෙනත් කෘති -

අපූරු තෑග්ග

එලීනා සහ රියානා

**Guzz** පූසාගේ අපූරු චාරිකාව

පූසාගේ බඩරිදිල්ල

**Liza's Dream**

## පිදුම

මෙම කෘතිය ලිවීමට මට උදව් උපකාර කළ

මගේ ආදරණීය

අප්පච්චීට, අම්මාට, ලොකුඅම්මාට,

අත්තාට, අත්තම්මාට සහ

චූටි නංගීටත්,

නිරතුරුවම මා දිරිමත් කරමින් යහමඟ පෙන්වන

ආදරණීය සමන්මලී ගුරුතුමියටත්

ඉතා සෙනෙහසින් හා ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථ කරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩ නැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවත් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ 'දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශශිකලා සේනාධිර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

**2023.11. 01**

# රජතුමාගේ උපාය

එකමත් එක රටක රොබට් කියලා රජතුමෙක් හිටියා. මේ රජතුමා හරි නුවණක්කාරයි, දක්ෂයි, කරුණාවන්තයි. ඉතින් මේ රටේ මිනිස්සුත් හරිම සතුටින් තමයි හිටියේ.

ඒත් මේ රටේ හිටියා දරුණු හොරු කණ්ඩායමක්. රජතුමාට නම් මේ හොරු කණ්ඩායම හිසරදයක් වෙලා තිබුණේ. මොකද මේ හොරු කණ්ඩායම ගැන හැමදාම පැමිණිල්ලක් එනවා.



ඔන්න ඉතින් දවසක් රොබට් රජතුමාට හිතුණා රටේ මිනිස්සුන්ගේ සැපදුක්, තොරතුරු, ප්‍රශ්ණ මොනවද? කියලා බලන්න.


හැබැයි රජතුමාට හිතුණා ඔටුන්න, රජ ඇඳුම් ඇඳගෙන ගියොත් සමහර මිනිස්සු බොරු කියයි කියලා. ඒ නිසා රජතුමා සංචාරකයෙක් වගේ වෙස් වලාගෙන තමයි ගියේ.

දැන් මේ රජතුමා ගෙදරින් ගෙදරට ගිහිල්ලා සැපදුක් කොහොමද? රජතුමා හොඳයිද? තියෙන ප්‍රශ්ණ මොනවද? කියලා ඇහුවා.

ඉතින් ඔහොම යනකොට රජතුමා දැක්කා කවුදෝ හොරෙන් හොරෙන් කැලෑව පැත්තට යනවා.

රජතුමත් හොරෙන් එයාලගේ පස්සෙන් ගියා. එයාලා ගියේ කැලෑව මැද තියෙන ගල් ගුහාවකට. ඒගොල්ලො ඇතුළට ගියාට පස්සේ රජතුමා හොරෙන් ගල්ගුහාවේ ඇතුලේ කවුද ඉන්නේ, ඇතුලෙ මොනවද වෙන්නේ කියලා ගුහාවේ බිත්තියක තියෙන සිදුරකින් බැලුවා. දැකපු දෙයින් රජතුමා පුදුම වුණා. ඇතුලේ කවුද දන්නවාද හිටියේ? ඇතුලේ හිටියෙ අර හොරු කණ්ඩායම.





රජතුමා එකපාරටම ඇතුළට පැන්නේ නෑ. එයා උපායක් කල්පනා කළා. රජතුමා දොරට තට්ටු කළා. එක හොරෙක් දොර ඇරියා. රජතුමා මෙහෙම කිව්වා.

"මම මේ වෙන රටක ඉඳන් ආවේ. ඒ රටෙත් මට කරන්න කිසිම වැඩක් නෑ. ඔබට පුළුවන්ද මට කරන්න වැඩක් හොයලා දෙන්න?"

"පොඩ්ඩක් ඔහොම ඉන්න. මම ගිහින් අපේ නායකතුමා එක්කං එන්නං"


ඉතින් අර හොරා ගිහින් නායකයට මෙහෙම කිව්වා.

"නායකතුමා අන්න අරෙහෙ කවුදෝ මිනිහෙක් ඇවිල්ලා වැඩක් ඉල්ලනවා. මම මුකුත් කිව්වේ නෑ. ඔබව එක්කං එන්නං කියලා මේ ආවේ."

"හරි හරි යංකො බලන්න" නායකයා කිව්වා.

නායකයා වෙස් වලාගත් රජතුමා ළඟට ගිහිල්ලා අර හොරා පෙන්නලා මෙහෙම කිව්වා.

"මෙයා කිව්වා නුඹ ආවේ කරන්න වැඩක් සොයාගෙන කියලා. දැන් මොනවද නුඹට කරන්න පුළුවන් වැඩ?"




"ඕන දෙයක් පුළුවන් නායකතුමනි" රජතුමා කිව්වා.

"හරි එහෙනං නුඹ අපේ හොරු කණ්ඩායමට එකතු වෙන්න. හොරකම් කරලා අපිට හොඳට සල්ලි හම්බකරන්න පුළුවන්. නුඹ කැමතිද?" නායක හොරා රජතුමාට කිව්වා.

"මම කැමතියි."

රජතුමා මූණේ සතුටක් මවාගෙන කිව්වා. ඉතිං රජතුමා කිහිප දවසක් මේ හොරු කණ්ඩායම එක්ක හොරකම් කළා. දවසක් රජතුමා හොර කණ්ඩායමේ නායකයාට කිව්වා.

"අපි මේ වගේ පොඩි පොඩි තැන් වලින් හොරකම් කරලා වැඩක් නෑ. අපි රජ වාසලට ගිහින් හොරකම් කරමු. මට ආරංචියක් ආවා රජතුමා ගමනක් ගිහින් කියලා. රජතුමාගේ



වස්තුව ඔක්කොම තියෙන්නේ ගබඩා කාමරේ. මම රාජපුරුෂයන්ට සිහිසුන් වෙන බීමක් දුන්නා. ගබඩා කාමරේ රාජ පුරුෂයන්ට සිහිය එන්න කලින් අපි ගිහින් හොරකම් කරමු."

"හරිම අපූරුයි! අපි දැන්ම ගිහින් හොරකම් කරමු."

නායකයා එහෙම කියලා හොරු කණ්ඩායමත් එක්ක රජ මාළිගාවට ගියා.

හොරු ටික ගබඩා කාමරයට ගිය ගමන් රාජපුරුෂයෝ දොර වැහුවා. හොරු ටික ගබඩා කාමරය ඇතුලේ හිර වුණා.

"මේ මොකද මේ නුඹලට සිහිසුන් වුණේ නැද්ද?" නායකයා කෑ ගැහුවා.

"නෑ එයාලට සිහිසුන් වුණා වගේ ඉන්න කිව්වා" රජතුමා හිනා වෙවී කිව්වා.

"ඇයි මෙයාව අල්ලගන්නේ නැත්තේ?" එක හොරෙක් ඇහුවා.

"එයාලා මොකටද මාව අල්ල ගන්නේ. මමනේ රජතුමා"

ඒ කතාව ඇහුව හොරු කණ්ඩායමට හොඳටම බය හිතුණා.



"වහාම මොවුන් සිරිගත කරනු" රජතුමා අණ කළා.

හොරු ටික සිරගත කරලා අවුරුද්දකට විතර පස්සේ රජතුමා හොරු ටික බලන්න ගියා.

"මම කැමතියි ඔයාලව මගේ සෙබළ කණ්ඩායමට එකතු කරගන්න. හැබැයි එක පොරොන්දුවක් පිට. ආය කවදාවත් හොරකම් කරන්න බෑ. හොරකම් කරලා අහුවුණොත් හිස ගසා දමනවා. එකඟයි ද?" රජතුමා ඇහුවා.

"එකඟයි" හොරු කණ්ඩායම කිව්වා.

එදා ඉදන් ඒ හොරු කණ්ඩායම රජ වාසලේ ඉන්න දක්ෂම සෙබළු වුණා. රජතුමාගේ නුවණ නිසා හොරු කණ්ඩායමට යහපතක්ම සිදුවුණා. ඒ විතරක්ද ඒ රටේ මිනිසුන්ට නැවත හොරුන්ගෙන් නම් කරදර වුණේ නෑ.

සැබෑ නායකයින් එහෙමයි. අපිත් සැබෑ නායකයින් වීමට අධිෂ්ඨාන කරගනිමු.

නිමි.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පරියේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මන් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

**2023.11.01**